සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

45 S I

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 12 - 2019

විභාග අංකය .....

බෞද්ධ ශිෂ්ටාචාරය I

කාලය පැය දෙකයි

වැදගත්

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එය සලකුණු කරන්න.**

01. මහා බ්‍රහ්මයා විසින් මිනිසුන්ගේ ගුණ - කර්ම භේදය සලකාගෙන සමාජයේ සිටින සියලු මිනිසුන් ප්‍රධාන කොටස් හතරකට බෙදා මවන ලද බව දැක්වෙන බ්‍රාහ්මණ ඉගැන්වීම නම්,

(1) ස්වධර්මයි. (2) වර්ණ ධර්මයි. (3) ආශ්‍රම ධර්මයි.
(4) ආපද් ධර්මයි. (5) නියාම ධර්මයි.

02. බ්‍රාහ්මණයෝ ඒ ඒ වර්ණයන්ට අයත් කාර්යයන් ස්වධර්ම නමින් හැඳින්වූහ. චතුර් වර්ණයට අයත් ස්වධර්ම පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ එය සමස්ත මානව සමාජයට ම බලවත් අසාධාරණයක් සිදුකර ඇති බවයි. ස්වධර්ම සංකල්පය තුළින් බ්‍රාහ්මණයන් අපේක්ෂා නොකරන ලද්දේ,

(1) ඒ ඒ කුල අතර සම්බන්ධතා ඇතිවීම වැළැක්වීමයි.
(2) බ්‍රාහ්මණ වංශිකයෝ සමකාලීන සමාජයේ ප්‍රබලතම ආඥාදායකයෝ වීමයි.
(3) ස්වාභිමතය පරිදි වෘත්තීන්හි නිරතවීමේ හැකියාව ලබාදීමයි.
(4) බ්‍රාහ්මණ ශ්‍රැතියට ගැති වී කටයුතු කිරීමට අවස්ථාව සැලසීමයි.
(5) පුද්ගලයාට අවශ්‍ය ශිල්ප - ශාස්ත්‍ර ඉගෙනීමේ අවකාශ නැති කිරීමයි.

03. බ්‍රාහ්මණයන් වර්ණ ධර්ම පදනම් කොටගෙන සමාජ ප්‍රභවය ඉගැන්වූ **බව " ब्राह्मणोऽस्य मुखमासीद् बाहु राजन्यः कृतः..."** යනාදී ඍග්වේද පාඨ මගින් කියවේ. මෙය අයත් මණ්ඩලය හා පුරුෂ සූක්තය වන්නේ,

(1) ඍග්වේදයේ 10වන මණ්ඩලයේ 92වන පුරුෂ සූක්තයයි.
(2) ඍග්වේදයේ 10වන මණ්ඩලයේ 89වන පුරුෂ සූක්තයයි.
(3) ඍග්වේදයේ 11වන මණ්ඩලයේ 90වන පුරුෂ සූක්තයයි.
(4) ඍග්වේදයේ 10වන මණ්ඩලයේ 90වන පුරුෂ සූක්තයයි.
(5) ඍග්වේදයේ 10වන මණ්ඩලයේ 93වන පුරුෂ සූක්තයයි.

04. බ්‍රාහ්මණ ආශ්‍රම ධර්ම අතරින් බ්‍රහ්මචාරී අවධියේ දී සම්පූර්ණ කළ යුතු මූලික කාර්ය ලෙස අවධාරණය කරනු ලබන්නේ,

(1) ශිෂ්‍යයකු වශයෙන් උගත මනා ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමයි.
(2) දිවි ඇතිතාක් බ්‍රහ්මචාරීව විසීමයි.
(3) ගෘහ ජීවිතය අතහැර බ්‍රහ්මචාරීව විසීමයි.
(4) සන්‍යාසියෙකු ලෙස බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමයි.
(5) කුමර - කුමරි ලෙස බ්‍රහ්මචාරී දිවියක් ගත කිරීමයි.

05. මහා බ්‍රහ්මයා විසින් චතුර් වර්ණය නිර්මාණය කර ඒ ඒ වර්ණයට නියමිත කාර්යයන් පැවරීමක් කරන ලදී. මෙහිදී වෛශ්‍යයන්ට සුවිශේෂ වූ කාර්ය ගණනාවක් නිර්දේශ කළ බව දැකගත හැකි විය. ඒවායින් කිහිපයක් නම්,

(1) දන්දීම, ඉගෙනීම හා ප්‍රභූන්ට මෙහෙවර කිරීම
(2) යාග කරවීම, දන් පිළිගැනීම,හා යාග කිරීම
(3) රට පාලනය කිරීම , දන්දීම හා වෙළඳාම් කිරීම
(4) ඉගැන්වීම, යාග කිරීම හා සත්ත්ව පාලනය කිරීම
(5) දන්දීම, යාග කිරීම හා සත්ත්ව පාලනය කිරීම

06. ස්වාමියා මළ පසු භාර්යාව ජීවත් වන්නේ නම් ඇය වාසය කළ යුත්තේ කිළිටි වස්ත්‍ර හැඳ රසවත් ආහාර පානාදියෙන් වැළකී කිසිදු ආභරණයක් නොපැළඳ මිය ගිය ස්වාමියාම පතමින් ගෘහ දාසියක වශයෙනි. මෙම චාරිත්‍රය බ්‍රාහ්මණ ධර්මයන්හි දැක්වෙන්නේ,

(1) පර්ධා චාරිත්‍ර වශයෙනි
(2) ගෘහීය චාරිත්‍ර වශයෙනි
(3) උපනයන චාරිත්‍ර වශයෙනි
(4) ශ්‍රාද්ධ පූජාව වශයෙනි
(5) සති පූජාව වශයෙනි

07. යාගය බ්‍රහ්මසහව්‍යතාව සඳහා ඇති එක ම මාර්ගය ලෙස වේදත්‍රයෙහි ම සඳහන් වේ. එය ඉහළ වර්ණවලට පමණක් සීමා වූ අතර ලෞකික අපේක්ෂා සාධනය ද එමඟින් අපේක්ෂා කර ඇත. නිසි පරිදි යාගයන් පැවැත්වීමට අත්‍යවශ්‍ය වන බ්‍රාහ්මණ පූජකවරුන් අතර "හෝතෘ" නාමයෙන් හඳුන්වා ඇත්තේ,

(1) යාග කරන්නා
(2) යාගයට ආරාධනා කරන්නා
(3) වේද පාඨ ගායනා කරන්නා
(4) යාගයේ අධ්‍යක්ෂක
(5) යාගයට පූජාද්‍රව්‍ය සපයන්නා

08. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව සාමාන්‍ය ජනතාව සඳහා එක් යාග ක්‍රමයක් ද ප්‍රභූන් සඳහා තවත් යාග ක්‍රමයක් ද රාජ්‍ය වංශිකයන් සඳහා වෙනම යාග ක්‍රමයක් ද පැවතුණි. යාග ප්‍රභේද අතර එන **"වාජපේය යාගය"** යන්නෙන් අදහස් කළේ,

(1) රජවරු අභිෂේක කිරීම සඳහා කරන යාගයයි.
(2) කුලහීන පිරිමින් බිලි දී කරන යාගයයි.
(3) මද්‍යපාන වර්ග පිළිගන්වමින් කරන යාගයයි.
(4) වටිනා අශ්වයින් බිලි දෙමින් කරන යාගයයි.
(5) යාග ස්ථම්භය ගව ලෙයින් නහවමින් කරන යාගයයි.

09. බුදුරජාණන් වහන්සේ පිරිමි පාර්ශ්වයට මෙන් ම කාන්තා පාර්ශවයට ද සමාන අයිතිවාසිකම් ලබා දීමට ක්‍රියා කළ සේක. ස්ත්‍රී - පුරුෂ භේදයකින් තොර ව ශාසනික ප්‍රතිලාභ උරුම කරදීම තුළින් ඒ බව පැහැදිළි වේ. භික්ෂුණී හා උපාසිකා පිරිස් සඳහා ද තනතුරු පවා ප්‍රදානය කළ සේක. ඒ අතර දිවැස් ඇති භික්ෂුණීන් අතර අග්‍රස්ථානය හා බහුශ්‍රැත උපාසිකාවන් අතර අග්‍රස්ථානය හිමි වුයේ,

(1) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියට හා විශාඛා උපාසිකාවට ය.
(2) පටාචාරා තෙරණියට හා සුජාතා උපාසිකාවට ය.
(3) සකුලා තෙරණියට හා ඛුජ්ජුත්තරා උපාසිකාවට ය.
(4) උප්පලවන්ණා තෙරණියට හා සාමාවතී උපාසිකාවට ය.
(5) ඛේමා තෙරණියට හා ඛුජ්ජුත්තරා උපාසිකාවට ය.

10. තමන් කෙලෙස් ගැටවලින් තොර යැයි කියා සිටි සාධුවරුන් ---------- නම් වූ අතර, ශ්වේතාම්බර හා දිගම්බර යනුවෙන් දෙයාකාර වූ ඔවුන් දුෂ්කර ව්‍රත අනුගමනය කළ පිරිසකි.

(1) ආජීවක
(2) පරිබ්‍රාජක
(3) ජටිල
(4) නිගණ්ඨ
(5) තීර්ථක

11. බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායට අනන්‍ය වූ ලක්ෂණයක් නොවන වරණය වන්නේ,

(1) පිණ්ඩපාතික ව එක් වේලේ පමණක් ආහාර ගන්නා, සරල දිවි පෙවෙතක් ගත කරන පිරිසකි.
(2) අත්තකිලමථානුයෝගයෙන් හා කාමසුඛල්ලිකානුයෝගයෙන් බැහැර වූ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන පිරිසකි.
(3) අතීය හා අනාගතය පිළිබඳ ශෝක නොඋපදවන, වර්තමානයෙන් යැපෙන, ප්‍රසන්න පෙනුමෙන් යුතු ශ්‍රමණ පිරිසකි.
(4) පාරිශුද්ධ වූ කාය, වාක්, මනඃ කර්ම ඇති කාය දණ්ඩය ප්‍රමුඛ ලෙස පිළිගත් පිරිසකි.
(5) නිවන මූලික පරමාර්ථය කොට ගෙන ඊට අදාළ ප්‍රතිපත්ති පිරූ පිරිසකි.

12. ෂට්ශාස්තෘවරු අතර, ස්වභාව නියතියකට අනුව සත්ත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදු වේ යැයි පවසන ---------- ශාස්තෘතුමා නියතිවාදියකු ලෙස ද අධිච්ච සමුප්පන්නවාදියකු ලෙස ද හැඳින්වේ.

(1) අජිත කේසකම්බල (2) සංජය බෙල්ලට්ඨිපුත්ත (3) පූරණ කස්සප
(4) පකුධ කච්චායන (5) මක්ඛලී ගෝසාල

13. පුද්ගලයාගේ ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාවය වගකීම ප්‍රකට කෙරෙන වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ.

(1) ''සරු දේ සරු ලෙසත් නිසරු දේ නිසරු ලෙසත් දැකිය යුතුය'' යන්න යි.
(2) "චේතනාව කර්මය වේ" යන්න යි.
(3) ''පව් කරන්නා දෙලොව ම තැවෙයි'' යන්න යි.
(4) ''තමා පිහිට තමාමය, අන්කිසි පිහිටක් නැත'' යන්න යි.
(5) ''තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නොකළ යුතුය'' යන්න යි.

14. බ්‍රහ්මජාල සූත්‍රයට අනුව සංජය බෙල්ලට්ඨිපුත්තගේ දර්ශනයෙන් මහජනයා වික්ෂිප්තයට පත්වේ. මොහුගෙන් සත්වයාගේ මරණින් මතු පැවැත්ම, පරලොව, කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක ආදිය පිළිබඳ විමසන විට නිශ්චිත පිළිතුරක් නොදෙයි. ඊට හේතු දක්වන බුදුසමය, **පිළිතුරු දෙනු ලබන කල්හි යමෙක් ප්‍රශ්න විචාරන්නේ නම්, එසේ ප්‍රශ්න කරනු ලැබීමට ඇති භය හා අකමැත්ත නිසා පිළිතුරු නොදී සිටීම** හඳුන්වා ඇත්තේ,

(1) "අනුයෝග භයා අනුයෝග පරිජේගුච්ඡා" යනුවෙනි.
(2) "මන්දත්තා මෝමූහත්තා" යනුවෙනි.
(3) "මුසාවාදභයා මුසාවාද පරිජේගුච්ඡා" යනුවෙනි.
(4) "උපාදාන භයා උපාදාන පරිජේගුච්ඡා" යනුවෙනි.
(5) "අඤ්ඤථාතිපි මේ නෝ "යනුවෙනි.

15. බටහිරින් පඤ්චාල රට ද දකුණින් ගංගා නදිය ද නැඟෙනහිරින් සදානීරා හෙවත් ගණ්ඩකී නදිය ද උතුරින් නේපාලිය කඳුකර පෙදෙස ද සීමා කොටගත් ප්‍රදේශය ---------- රාජ්‍යයට අයත් විය.

(1) මගධ (2) අවන්ති (3) කෝසල (4) වත්ස (5) මල්ල

16. බුද්ධකාලීන භාරතීය බ්‍රාහ්මණ සංස්කෘතිය හා ශ්‍රමණ සංස්කෘතිය එකිනෙක සැසඳීමේ දී පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) බ්‍රාහ්මණ සංස්කෘතිය මෙන්ම ශ්‍රමණ සංස්කෘතිය ද මිනිසාගේ ආගමික නිදහස අගය කරයි.
(2) ශ්‍රමණ සංස්කෘතිය කර්ම මාර්ගය ප්‍රතික්ෂේප කරන අතර බ්‍රාහ්මණ සංස්කෘතිය එය පිළිගනියි.
(3) බ්‍රාහ්මණ සංස්කෘතිය උපත පදනම් කොටගෙන මිනිස් සමාජය වර්ගීකරණයට ලක් කරන අතර ශ්‍රමණ සංස්කෘතිය ද එය පිළි ගනියි.
(4) බ්‍රාහ්මණ සංස්කෘතිය මෙන්ම ශ්‍රමණ සංස්කෘතිය ද කාන්තා නිදහස අගය කරයි.
(5) බ්‍රාහ්මණ සංස්කෘතිය ඊශ්වර නිර්මාණවාදය බැහැර කරන අතර ශ්‍රමණ සංස්කෘතිය එය පිළිගනියි.

17. ජෛන ඉගැන්වීම් අනුව සුඛ, දුක්ඛ හා අදුකඛමසුක මිනිසාට ලැබෙන්නේ පූර්වකෘත කර්ම ශක්තියෙන් බැවින් එම කර්මය ගෙවාදැමිය යුතු බවත් ඊට අත්තකිලමතානුයෝගී ප්‍රතිපදාව සුදුසු බවත් පැහැදිලි කරයි. ඒ අනුව බුදුරජාණන් වහන්සේ අත්තකිලමතානුයෝගයෙහි දෝස තුනකක් පෙන්වා දුන් සේක. එම දෝෂ අයත් නිවැරදි වරණය නම්,

(1) හීනය, ග්‍රාම්‍යය හා අනාර්ය වශයෙනි
(2) දුක්ඛය, අනාර්ය හා පෘථග්ජනය වශයෙනි
(3) දුක්ඛය, අනාර්ය හා නිවනට හේතු නොවේ වශයෙනි
(4) ග්‍රාම්‍යය දුක්ඛය, අනාර්ය වශයෙනි
(5) නිවනට හේතු නොවේ, දුක්ඛය හා හීනය වශයෙනි

18. "බුද්ධිමත් වූ ද සිල්වත්වූ ද ඇතැම් ස්ත්‍රීහු නැදිමයිලන් දෙවියන් සේ පුදන්නියෝ පතිව්‍රතාවෙන් ද යුක්ත වෙති. ඒ නිසා ස්ත්‍රිය පෝෂණය කළ යුතු ය. එබඳු ස්ත්‍රීන් නිසා උපදින දරුවෝ ද සූරයෝ වෙති." මෙම ප්‍රකාශය ---------- ප්‍රකාශ කරන ලද්දකි.

(1). සෝමා තෙරණිය විසින් මාරයා අරබයා (2). ආනන්ද තෙරුන් විසින් කොසොල් රජු අරබයා
(3). දේවතාවියක් විසින් කුණ්ඩලකේසිය අරබයා (4). බුදුරදුන් විසින් කොසොල් රජු අරබයා
(5). බුදුරදුන් විසින් ආනන්ද තෙරුන් අරබයා

19. ප්‍රාග් බෞද්ධ දේශපාලන ව්‍යූහය සකස් වී තිබූ ආකාරය ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ භාරතීය දේශපාලන තත්වය විමසීමේ දී පැහැදිලි වේ. බෞද්ධ මූලාශ්‍රය තුළින් ද ප්‍රකට වන්නේ බුදුරදුන් සමකාලීන පාලකයන් සමඟ සබඳතා පැවැත් වූ ආකාරයයි . එකල ප්‍රකට ආරාම දෙකක් වූ රාජකාරාමය හා වේළුවනාරාමය පිහිටා ඇති ජනපද වූයේ,

(1) කාම්බෝජය හා අවන්තියයි (2). කෝසලය හා වත්සයයි (3). වත්ස හා අවන්තියයි
(4). මගධ හා ගන්ධාරයයි (5). කෝසලය හා මගධය යි

20. කූටාගාර ශාලාව, උදේන, ගෝතමක, සත්තම්භ, සාරන්දද, චාපාල හා බහුපුත්ත ආදී චෛත්‍යයන් ද ගෝසිංගසාල හා අම්බපාලී වනෝද්‍යානය ද බුදුන් වහන්සේ අවසන් වස විසූ බේලුව ග්‍රාමය ද ---------- පිහිටා තිබුණි.

(1) වජ්ජි රාජ්‍යයේ (2) මගධ රාජ්‍යයේ (3) මල්ල රාජ්‍යයේ
(4) වත්ස රාජ්‍යයේ (5) කුරු රාජ්‍යයේ

21. බුද්ධකාලීන භාරතය තුළ දියුණු ආර්ථික ක්‍රමයක් පැවැති බවට සාධක ත්‍රිපිටක සාහිත්‍යයෙන් පමණක් නොව ඉන්දීය ඉතිහාසය තුළින් ද පැහැදිළි වේ. ඒ අනුව දියුණු වාණිජ ආර්ථිකයක් පැවැති බවට ඉදිරිපත් කළ හැකි කදිම සාධකයක් නොවන්නේ,

(1). ජනප්‍රියත්වයට පත් වෙළඳ වරායවල්, නගර සහ මාර්ග පැවැතීම.
(2). හුවමාරු මාධ්‍යයක් ලෙස කාසි භාවිතයට පැමිණීම.
(3). වෙළඳ කටයුතු සඳහා තවලම් හා ගැල් යොදාගැනීම.
(4). විශාල ධනයකට හිමිකම් කියූ සිටුවර පන්තියක් බිහිවීම.
(5). මගධ කෙත්යායේ ආකෘතියට අනුව බෞද්ධ භික්ෂූන්ගේ සිවුරු සකසා ගැනීම.

22. වරෙක ඇගයීමටත්, තවත් වරෙක ගැරහීමටත්, වරෙක සම්මානයටත්, වරෙක අවමානයටත්, වරෙක පූජනීයත්වයටත්, තවත් වරෙක තාඩන පීඩනයන්ටත් ලක්වූ පිරිසක් ලෙසින් භාරතීය වනිතාව හැඳින්විය හැකිය. ඒ අනුව බෞද්ධ ආභාෂය ලැබූ කාන්තාව,

(1) සමාජයේ පහත් තැනක සිටියා ය.
(2) ආගමික, සාමාජික, ආර්ථික හා අධ්‍යාපනික යන සෑම අංශයකම අයිතිවාසිකම් ලැබුවා ය.
(3) පුරුෂ පක්ෂයට හිමි අයිතිවාසිකම්වලින් බැහැර වූවා ය.
(4) තමා කැමැති ස්වාමියකු තෝරාගැනීමට අවසර නොලද්දී ය.
(5) තමා කැමැති රැකියාවක යෙදීමට අවස්ථාව නොලැබුවා ය.

23. ඉතා ප්‍රසිද්ධ ආචාරිනියක් ලෙසින්ද, දක්ෂ දේශිකාවක් ලෙසින්ද, සමාජ සේවිකාවක් වශයෙන්ද ප්‍රසිද්ධියට පත්ව ''ධම්ම කථිකා'' නම් තනතුරකින් පවා පිදුම් ලැබූ භික්ෂුණිය වන්නේ,

(1) ධම්මා තෙරණියයි. (2) සුක්කා තෙරණියයි. (3) අනෝපමා තෙරණියයි.
(4) ධම්මදින්නා තෙරණියයි. (5) පටාචාරා තෙරණියයි.

24. බුද්ධකාලීන භාරතයේ විසූ ෂට් ශාස්තෘවරු සියලු දෙනා ජනතාවගේ ගරුබුහුමන් ලැබූ ආගමික නායකයෝ වූහ. ඔවුන් සියලු දෙනා ම පිළිනොගත් ආගමික මතයක් වන්නේ,

(1) සියලු මිනිසුන් මරණයෙන් උච්ඡේදයට පත්වන බවයි.
(2) සියලු දෙනා නියතියකට අනුව සසර ගමන් කරන බවයි.
(3) සමාජයේ යහ පැවැත්මට කුලභේදය අත්‍යවශ්‍ය බවයි.
(4) කිසිවකු කරන හොඳ හෝ නරක ක්‍රියාවකට විපාකයක් නැති බවයි.
(5) සියලු දෙනා සදාතනික පරමාණු පදාර්ථවලින් නිර්මාණය වී ඇති බවයි.

25. බුදුරජාණන් වහන්සේ විසින් **රාජ භටයන් පැවිදි නොකළ යුතුයැයි අනුදැන වදාළේ** ---------- -රජුගේ ඉල්ලීම මත ය.

(1) බිම්බිසාර (2) උදේන (3) පසේනදී කොසොල් (4) චණ්ඩපජ්ජෝත. (5) අජාසත්

26. ක්‍රි.පූ. අටවන සියවසේ පෞර රාජ්‍ය බිඳ වැටීම හා අග නගරය මාරුවීම නිසා ද ප්‍රාදේශික රජවරු විසින් කුඩා කුඩා රාජ්‍ය පිහිටුවා ගැනීම නිසා ද ජනපද සොළොසක් ඇති විය. ඒ ජනපද ඇතැම් ඒවා රාජාණ්ඩු ලෙස ක්‍රියාත්මක වූ අතර ඇතැම් ඒවා සමූහාණ්ඩු ලෙස ක්‍රියාත්මක විය. එම සමූහාණ්ඩු ක්‍රමය තුළ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

(1) ව්‍යවස්ථාදායක, විධායක. අධිකරණ යන ත්‍රිවිධ බලතල, කණ්ඩායමක් මඟින් ක්‍රියාත්මක කිරීම
(2) සාමූහික ව සාකච්ඡා කොට, සාමූහික ව තීරණ ගෙන, ක්‍රියාත්මක කිරීම
(3) සප්ත අපරිහානීය ධර්ම පදනම් කොටගත් සාර්ථක ගණතන්ත්‍ර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
(4) ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල රජුට අහිමි වීම.
(5) යුවරජ, පුරෝහිත, අධිකරණ නායක, සේනාධිපති මඟින් බලය ක්‍රියාත්මක වීම.

27. සොළොස් මහා ජනපද අතර වජ්ජි රාජ්‍යයේ භූගෝලීය පිහිටීම වන්නේ,

(1) ගංගා නදියට උතුරු ප්‍රදේශය
(2) බටහිරින් පඤ්චාල රට ද දකුණින් ගංගා නදිය ද නැඟෙනහිරින් සදානීරා (ගණ්ඩකී) නදිය ද උතුරින් නේපාලිය කඳුකර පෙදෙස ද සීමා කොටගත් ප්‍රදේශය
(3) අවන්ති රටට උතුරෙන් යමුනා නදී තීර ප්‍රදේශය
(4) බටහිරින් ශාක්‍ය ජනපදය ද දකුණින් අවන්ති රට ද යන ප්‍රදේශය
(5) උතුරෙන් ගංගා නදිය ද නැඟෙනහිරින් චම්පා නදිය ද නිරිතෙන් වින්ධ්‍යා කඳුවැටිය ද බටහිරින් සෝණ නදිය ද සීමා කොටගත් ප්‍රදේශය

28. ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද සිදු වූයේ ---------- දී ය.

(1) වජ්ජීන්ගේ කූටාගාර ශාලාවේ
(2) ශාක්‍යයන්ගේ න්‍යග්‍රෝධාරමයේ
(3) මල්ලරජදරුවන්ගේ අඹවනයේ
(4) සෝෂිතාරාමයේ
(5) ජේතවනාරාමයේ

29. මහාකච්චායන තෙරුන්ගෙන් බණ අසා තෙරුවන් සරණ යන ලද්දේ,

(1) උදේන රජ ය.
(2) චණ්ඩපජ්ජෝත රජ ය.
(3) අජාසත් රජ ය.
(4) කොසොල් රජ ය.
(5) පරන්තප රජ ය.

30. බුදුරජාණන් වහන්සේ සමකාලීන පාලකයන් සමඟ ද නිරන්තර සබඳතා පැවැති වූ සේක. ඒ අතර මගධයෙහි බිම්බිසාර හා අජාසත් යන රජවරුන් ද කැපී පෙනේ. බුදුරජාණන් වහන්සේ විසින් අජාසත් රජ අරභයා දේශනා කළ සූත්‍රය වන්නේ

(1) තිරෝකුඩ්ඩ සූත්‍රයයි.
(2) බ්‍රහ්මජාල සූත්‍රයයි.
(3) අග්ගඤ්ඤ සූත්‍රයයි.
(4) සාමඤ්ඤඵල සූත්‍රයයි.
(5) කූටදන්ත සූත්‍රයයි.

31. ජෛන මහාවීර හෙවත් නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයාගේ ඉගැන්වීම් තුළ දර්ශනවාද කිහිපයක් දක්නට ලැබේ. චතුයාම සංවරවාදය, පුබ්බේකත හේතුවාදය, පරම අවිහිංසාවාදය, කාය දණ්ඩවාදය, යනුවෙන් දැක්වෙන්නේ එයින් කිහිපයකි. මොහුගේ ඉගැන්වීම්වලට ඇතුළත් විය යුතු අනෙක් දර්ශන වාදය වන්නේ,

(1) අනාත්ම වාදයයි.
(2) අහේතු අපච්චයතා වාදයය
(3) ආත්ම වාදයයි.
(4) සුඛ පරම වාදයයි.
(5) නියති වාදයයි.

32. මූලික බෞද්ධ ඉගැන්වීම් පරීක්ෂා කිරීමේදී එහි අසහාය දෙවි කෙනෙකුගේ පැවැත්ම හෝ විශ්වය කෙරෙහි අධිකාරිත්වය පැනවීම නො පිළිගන්නා බව තහවුරු වේ. බුදුදහම මානව කේන්ද්‍රීය දහමක් ලෙස හැඳින්වීමට බොහෝ උගතුන් පෙළඹී ඇත්තේ එහි අන්තර්ගත,

(1) භෞතික ලෝකය ඇසුරින් තම ඉගැන්වීම් ඉදිරිපත් කළ නිසා ය.
(2) අදිච්ච සමුප්පන්නවාදී ලක්ෂණ නිසා ය.
(3) කර්මයෙහි පවත්නා නියතිවාදී ස්වභාවය නිසා ය.
(4) පාර භෞතික ඉගැන්වීම් පිළිබඳ අවධානය යොමු කළ නිසා ය.
(5) මානව ශක්‍යතාවයන් අගය කිරීමේ ගුණය නිසා ය.

33. බුද්ධකාලීන භාරතීය ආර්ථිකය තුළ වාණිජ කටයුතුවල නිරත වූ සමාජ පන්තිය හැඳින්වුයේ ,

(1) වෛශ්‍යයන් ලෙස ය
(2) මහා සෙට්ඨී ලෙස ය.
(3) බත්තිය ලෙස ය.
(4) උත්තර සෙට්ඨී ලෙස ය.
(5) සෙට්ඨී ලෙස ය.

34. කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ට රාජානුග්‍රහය ලබාදිය යුතු බව දැක්වෙන සූත්‍රය වන්නේ,

(1) කසීභාරද්වාජ සූත්‍රය (2) මහාපරිනිබ්බාන සූත්‍රය (3) ධම්මචේතිය සූත්‍රය
(4) කූටදන්ත සූත්‍රය (5) දේවදහ සූත්‍රය

35. බුදුදහමට අනුව මිනිස් සමාජයේ ප්‍රභවය හේතු ඵලදහමට යටත්ව ඇතිවූවකි. ඊට ජීව විද්‍යාත්මක සාධක ඉදිරිපත් කරන බුදුසමය වෘක්ෂලතා හා සත්ව ජීවිත සම්බන්ධයෙන් වෙනස්කම් ඇති බව පිළිගන්නා නමුත් මිනිස් ප්‍රජාව එක ම වර්ගයක් බවත් අවධාරණය කරයි. එය සෘජුව ම ප්‍රකාශ වන සූත්‍රය වන්නේ,

(1) මජ්ඣිම නිකාය උපාලි සූත්‍රයයි (2) මජ්ඣිම නිකාය වාසෙට්ඨ සූත්‍රයයි
(3) මජ්ඣිම නිකාය අරියපරියේසන සූත්‍රයයි (4) මජ්ඣිම නිකාය මධුර සූත්‍රයයි
(5) මජ්ඣිම නිකාය කණ්හකත්ථල සූත්‍රයයි

36. කාන්තාවන්ට බෞද්ධ නිවසක දී හිමිවිය යුතු සම්භාවනීයත්වය බුද්ධ දේශනාවන් තුළින් ම නිර්ණය වී ඇත. විසි එක්වන සියවසේ දී පවා නොලැබෙන ඉහළ ම පෙළේ අයිතිවාසිකම් සමුදායක් ඇයට ලබා දුන්බව සිගාලෝවාද සූත්‍ර දේශනාවෙන් වුව පැහැදිලි වෙයි. එහි දැක්වෙන ආකාරයට ස්වාමියා විසින් බිරිඳට කළ යුතු යුතුකම් පහට අයත් නොවන වරණය වන්නේ,

(1) බිරිඳට ගෞරවාන්විත ව පිළිපැදීම (2) අවමන් නොකිරීම
(3) පාපයෙන් වැළැක් වීම (4) ඇයට අවංකව පතිනිවත රැකීම
(5) නිවසේ ප්‍රමුඛත්වය පැවරීම

37. ෂට් ශාස්තෘවරු අතර විශ්වය තුළ කිසිවකු විසින් නිර්මාණය නො කරන ලද නො උපදවන ලද පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව යනුවෙන් නිත්‍ය පදාර්ථ හතක් පමණක් ඇතැයි ---------- ශාස්තෘවරයා උගන්වා ඇත.

(1) සංජය බෙල්ලට්ඨිපුත්ත (2) පූරණකස්සප (3) අජිත කේසකම්බලී
(4) මක්ඛලී ගෝසාල (5) පකුධ කච්චායන

38. බෞද්ධ දර්ශනය පිළිබඳව පෙරදිග හා අපරදිග රටවල ඇතැම් උගතුන් යම් යම් අදහස් ඉදිරිපත් කර ඇත. ඒවායින් ඇතැම් අදහස් බෞද්ධ දර්ශනය නිවැරදිව අවබෝධ කර නොගැනීම නිසා ඉදිරිපත් වූ ඒවා බව හැඟේ. පහත සඳහන් කරුණුවලින් බෞද්ධ දර්ශනයට වඩාත් අනුරූපී ඉදිරිපත් වීම වන්නේ,

(1). බුදුරදුන් ආර්ථික දේශපාලනික කරුණු සම්බන්ධයෙන් සම්පූර්නයෙන්ම නිහඬවූහ.
(2). රටක ආර්ථික හා දේශපාලන දර්ශනය සකසා ගැනීමට ප්‍රයෝජනවත් මූලධර්ම රැසක් ඉදිරිපත් කළහ.
(3). ආර්ථික කරුණු සම්බන්ධයෙන් නිහඬ වූ අතර පූර්ණ දේශපාලන දර්ශනයක් ඉදිරිපත් කළහ.
(4). අංග සම්පූර්ණ ආර්ථික හා දේශපාලනික දර්ශනයක් ඉදිරිපත් කළහ.
(5). දේශපාලන කරුණු සම්බන්ධයෙන් නිහඬ වූ අතර පූර්ණ ආර්ථික දර්ශනයක් ඉදිරිපත් කළහ.

39. බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර ඉතා වැදගත් කොට සළකනු ලබන වණ් ධම් හෙවත් කුලක්‍රමය බෞද්ධ ඉගැන්වීම් තුළින් දැඩිලෙස විවේචනයට ලක්ව ඇත. එසේ විවේචනයට ලක් කෙරුණු සූත්‍රයක් වන්නේ,

(1) පත්තකම්ම සූත්‍රයයි (2) චක්කවත්ති සීහනාද සූත්‍රයයි
(3) වෙළුද්වාර සූත්‍රයයි (4) අග්ගඤ්ඤ සූත්‍රයයි
(5) අණන සූත්‍රයයි

40. "යෝන කාම්බෝජ යන ජනපද වල ආයර් අනායර් යනුවෙන් කුල දෙකක් තිබී ඇති බව විස්තර වෙයි. වරින්වර ආය්‍යයන් අනාය්‍යයන් බවටත්, අනාය්‍යයන් ආය්‍යයන් බවටත් පත් වූ බව දැක්වේ. එමගින් කුල ක්‍රමය ස්ථිර සාර ඉගැන්වීමක් නොවන බව පෙනේ." මින් පැහැදිලි කර ඇත්තේ,

(1) සමාජවිද්‍යාත්මක සාධකයි (2) ජීවවිද්‍යාත්මක සාධකයි
(3) මනෝවිද්‍යාත්මක සාධකයි (4) දේශපාලනික සාධකයි
(5) ඓතිහාසික සාධකයි

41. සත්වයාගේ කෙළෙසීම හෝ විශුද්ධිය පිණිස කිසිදු හේතුඵල සම්බන්ධයක බලපෑමක් නැත. තමාගේ හෝ මෙරමාගේ යහපත පිණිස යැයි කළයුතු දෙයක් නැත. සත්වයන්ට නිශ්චිත වූ වීර්යයක්, බලයක් හෝ ආත්ම ශක්තියක් ද නොමැත. යන මෙම ආගමික ඉගැන්වීම හැඳින්වෙන්නේ,

(1) අමරා වික්ඛේපවාදය ලෙස ය
(2) අහේතු අපච්චයතාවාදය ලෙස ය
(3) අකිරිය වාදය ලෙස ය
(4) ශාස්වතවාදය ලෙස ය
(5) සංශයවාදය ලෙස ය

42. බ්‍රාහ්මණ මතවාදවල පමණක් නොව ශ්‍රමණ සම්ප්‍රදායට අයත් ජෙන දර්ශනයේ පවා කාන්තා විමුක්තියට බාධා ඇති බව පෙන්වා දෙයි. එහෙත් බුදුදහම තුළ එවැනි බාධාවක් කාන්තාවන්ට නොතිබුණ බව පැහැදිලි වන්නේ,

(1) ථේරී ගාථා පාලියේ දක්වෙන උදාන වාක්‍ය තුළිනි
(2) ගෙදර බුදුන් ලෙස මව නම් කිරීම තුළිනි
(3) ආහුනෙය්‍ය, පුබ්බාචරිය වැනි තත්වයෙන් පිදුම් ලැබීම තුළිනි
(4) ඒ ඒ තැනේ දී කාන්තාව පවා විචාරශීලි වන බව බුදුරදුන් දේශනා කිරීම තුළිනි
(5) මෙලොව බ්‍රහ්මයා ලෙස ගෞරවයට පාත්‍ර කිරීම තුළිනි

43. භාරතීය දර්ශන වාද අතර පුද්ගල ස්වාමිත්වයට හා ස්වාධීනත්වයවයට හානි ඇතිකරන පුබ්බේකත හේතුවාදය, ඊශ්වර නිර්මාණවාදය, ශංසයවාදය හා නියතිවාදය බැහැර කරන බුදුසමය ඉදිරිපත්කරන ලද ප්‍රධානතම ඉගැන්වීම වන්නේ,

(1) සංසාර ශුද්ධිවාදයයි.
(2) ශාස්වතවාදයයි.
(3) කර්මවාදයයි.
(4) උච්ඡේදවාදයයි
(5) හේතුඵලදහමයි.

44. බ්‍රාහ්මණ මතය අනුව එකල කාන්තාවට ආගමික කටයුතුවල නියැලීම, ආගමික ස්ථාන කරා ගමන් කිරීම පවා සපුරා තහනම් විය. එහෙත් බුදුසමය පෙහෙවස් සමාදන් වී ගුණගරුක ජීවිතයක් ගතකරන උපාසිකාව ස්ත්‍රීරත්නයක් ලෙස සලකයි. උපාසිකාවන් අතර විවිධ දක්ෂතා හා හැකියා ඇති කාන්තාවන්ට තථාගතයන් වහන්සේ විවිධ තනතුරුපවා ප්‍රධානය කළ සේක. එහිදී **විශ්වාස දේ කියන්නා වූ උවැසියන් අතර අගතනතුර, අචල ප්‍රසාදය ඇති උවැසියන් අතර අගතනතුර හා ගිලන් වූ භික්ෂූන්ට උපස්ථාන කරන උවැසියන් අතර අගතනතුර** හිමි වූ උපාසිකාවන් අයත් වරණය තෝරන්න.

(1) සාමාවතී, කාලි හා සුප්පියා යන උපාසිකාවන් ය
(2) සුජාතා, කාතියානි හා කාලි යන උපාසිකාවන් ය
(3) නකුලමාතා, කාතියානි හා සුප්පියා යන උපාසිකාවන් ය
(4) විශාකා, උත්තරානන්ද මාතා හා බුජ්ජුත්තරා යන උපාසිකාවන් ය
(5) නකුලමාතා, සාමාවතී හා සුප්පියා යන උපාසිකාවන් ය

45. ජෙන දර්ශනයේ නිර්දේශිත පංචශීල ප්‍රතිපත්තිය තුළ **සර්ව විරමණය** හෙවත් **සර්ව විරතිය** යනුවෙන් පෙන්වාදී ඇත්තේ,

(1) සියල්ල පිළිබඳ විමර්ශනශීලි බවයි.
(2) සියල්ලටම කායදණ්ඩය මුල්වන බවයි
(3) සියලු හිංසාවන්ගෙන් වැළකීමයි
(4) සියල්ල අත්හැර දැමීමයි
(5) සියලු ආකාරයෙන් ම අබ්‍රහ්මචර්යාවෙන් වැළකීමයි

46. බ්‍රාහ්මණ ධර්මවලට අනුව ධර්ම, අර්ථ, කාම හා මෝක්ෂ යන චතුර්විධ පුරුෂාර්ථයන් ලැබීමට ගමන් කළයුතු මාර්ගය වන්නේ,

(1) චතුර් ආශ්‍රම ධර්ම පිළිපැදීමයි
(2) ආගමික සංස්කාර ඉටුකිරීමයි
(3) යාග - හෝම සිදු කිරීමයි
(4) ස්වධර්ම නිසි ලෙස ඉටු කිරීමයි
(5) වර්ණ ධර්මවලට යටත්ව කටයුතු කිරීමයි

47. කුණ්ඩලකේසී භික්ෂුණිය ගිහි කල බොහෝ ජීවන ගැටලුවලට මුහුණ දුන්නා ය. වාද දහසක් ඉගෙන වාදකරමින් භාරතය පුරා සැරසරමින් සිට සැරියුත් තෙරුන් සමග වාද කොට පැරදී පසුව බුදු සසුනේ පැවිදි වූවා ය. බෞද්ධ භික්ෂුණියක් වීමට පෙර ඇය ගරු කළ ශ්‍රමණ සම්ප්‍රදාය නම්,

(1) ජටිල ශ්‍රමණ සම්ප්‍රදායයි
(2) නිගණ්ඨ ශ්‍රමණ සම්ප්‍රදායයි
(3) තාපස ශ්‍රමණ සම්ප්‍රදායයි
(4) පරිබ්‍රාජක ශ්‍රමණ සම්ප්‍රදායයි
(5) තීර්ථක ශ්‍රමණ සම්ප්‍රදායයි

48. බ්‍රාහ්මණ ආගමික සංස්කාරයක් වන උපනයනයෙන් පසු බ්‍රාහ්මණයා **"ද්විජ"** නමින් හඳුන්වන්නේ,

(1) පූනනූලක් කරේ පළඳවන බැවිනි
(2) දෙවරක් ඉපදීම සංකේතවත් කරන බැවිනි
(3) බ්‍රහ්ම සහව්‍යතාව ලැබූ බැවිනි
(4) යාග භූමියට සුදුසු බැවිනි
(5) ගෘහස්ථ ආශ්‍රමයට සුදුසු බැවිනි

49. කර්මවාදියෙකු වූ ජෛන මහාවීරයන්ගේ අටවැදෑරුම් කර්ම ප්‍රභේද අතර **දර්ශනාවරණීය කර්ම** යනු,

(1) ආයුෂ ඇතිකරන කර්මයි
(2) දුක ඇතිකරවන කර්මයි
(3) පුද්ගලයා මුලා කරන කර්මයි
(4) පුද්ගලයා දියුණු කරවන කර්මයි
(5) ආත්මය කලිටි කරන කර්මයි

13. බුද්ධ කාලයේ රෙදිපිලි කර්මාන්තය සම්බන්ධව---------- ප්‍රචලිතව පැවැති ප්‍රධාන වෙළඳ නගරයකි.

(1) සැවැත්නුවර
(2) පාවානුවර
(3) බරණැස්නුවර
(4) කුසිනාරානුවර
(5) රජගහ නුවර

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

45	S	II

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 12 - 2019

විභාග අංකය .....

බෞද්ධ ශිෂ්ටාචාරය II

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

I කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)

1. i. වර්ණ ධර්මයෙහි ප්‍රභවය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් ඉදිරිපත් කරන්න.
   ii. වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම නම් කරන්න.
   iii. වානප්‍රශ්ථ ආශ්‍රම ධර්මය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   iv. ආපද් ධර්ම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි විස්තර කරන්න.
   v. චතුර් ආශ්‍රම බුදු දහමින් ප්‍රතික්ෂේප වන ආකාරය පෙන්වා දෙන්න.

2. i සොළොස් මහා ජනපද බිහිවීම කෙරෙහි බලපෑ ඓතිහාසික සංසිද්ධිය කෙටියෙන් දක්වන්න.
   ii සොළොස් මහා ජනපද නම් කරන්න.
   iii මගධ රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   iv රාජාණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ හතරක් ගෙනහැර දක්වන්න.
   v ගණතන්ත්‍ර හෙවත් සමූහාණ්ඩු පාලනය යනු කුමක්දැයි පෙන්වා දෙන්න.

3. i ආජීවක හා ජටිල යන ශ්‍රමණ ගුරුකුල දෙක පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   ii ශ්‍රමණ සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණ හතරක් නම් කරන්න.
   iii 'සම්මාපාය' යාගය හඳුන්වන්න.
   iv බ්‍රාහ්මණ යාගය වෙනුවට බුදුරදුන් නිර්දේශිත ක්‍රියාකාරකම් පෙන්වා දෙන්න.
   v බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය සෙසු ශ්‍රමණ සම්ප්‍රදායන්ගෙන් වෙනස් වන මූළික ලක්ෂණ හතරක් දක්වන්න.

II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න තුනක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.)

4. i කර්මය පිළිබඳ ජෛන ඉගැන්වීම් පැහැදිලි කොට එය බුදු සමයෙහි කර්ම සංකල්පයෙන් වෙනස්වන අයුරු පැහැදිළි කරන්න.
   ii අජිත කේසකම්බලී ශාස්තෘවරයාගේ දර්ශනය පිළිබඳ හැඳින්වීමක් කොට එය බුදු දහමින් බැහැර වන්නේ කුමක් නිසාදැයි විමසන්න.

5. i බ්‍රාහ්මණයන් නිර්දේශ කළ වර්ණ භේදයේ, නිස්සාරත්වය ප්‍රකට කිරීම උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කරන ලද ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.
   ii ස්වධර්ම සංකල්පයෙන් බමුණන් සමාජ ආධිපත්‍යය තහවුරු කරගැනීමට ගත් උත්සහය ප්‍රකට කරන්න.

6. i ස්ත්‍රීත්වය පිළිබඳ බ්‍රාහ්මණ සමාජයේ පැවැති ආකල්පය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
   ii බෞද්ධ ඉගැන්වීම් මගින්, ගෘහස්ථ සමාජය තුළ කාන්තාවට අභිමානවත් ලෙස දිවිගෙවීමට අවස්ථාව ලබාදී ඇති අයුරු සහේතුකව පෙන්වා දෙන්න.

7. i බුද්ධකාලීන භාරතයේ පැවැති වාණිජ ක්ෂේත්‍රයෙහි දියුණුව පෙන්වා දෙමින් ඒ තුළින් ඇති වූ සමාජ පරිවර්තනයන් දක්වන්න.
   ii බුද්ධකාලීන භාරතීය පාලකයින් සහ බුදුරජාණන් වහන්සේ අතර පැවැති සබඳතා බුදු දහමේ උන්නතියට මෙන්ම පාලකයින්ගේ උන්නතියට ද හේතු වූ අයුරු විමසන්න.

8. i ෂට් ශාස්තෘවරුන්ගේ ඇතැම් ඉගැන්වීම් තුළින් සදාචාරයට වටිනාකමක් ලබාදී නොමැති අයුරු පෙන්වා දෙන්න.
   ii ෂට් ශාස්තෘවරුන්ගේ සදාචාර විරෝධී ඉගැන්වීම් බුදු දහමින් ප්‍රතික්ෂේපවන අයුරු පැහැදිලි කරන්න.

පළමු වාර පරීක්ෂණය 2019 - 12 ශ්‍රේණිය
- බෞද්ධ ශිෂ්ටාචාරය - පිළිතුරු

I පත්‍රය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01	2	26	5
02	3	27	1
03	4	28	3
04	1	29	2
05	5	30	4
06	1	31	3
07	2	32	5
08	5	33	1
09	3	34	4
10	4	35	2
11	1	36	3
12	5	37	5
13	4	38	2
14	1	39	4
15	3	40	1
16	2	41	2
17	3	42	1
18	4	43	5
19	5	44	3
20	1	45	4
21	5	46	1
22	2	47	4
23	4	48	2
24	3	49	5
25	1	50	3

II පත්‍රය

1. i. වර්ණ ධර්මයෙහි ප්‍රභවය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් ඉදිරිපත් කරන්න.

- බ්‍රාහ්මණයන් වර්ණ ධර්ම පදනම් කොටගෙන සමාජ ප්‍රභවය ඉගැන්වූ බව.
- එම ඉගැන්වීම් සෘග්වේදයේ 10 වන මණ්ඩලයේ 90 වන පුරුෂ සූක්තයේ සඳහන් වන බව.

'' බ්‍රාහ්මණෝස්‍ය මුඛමාසිද් - බාහු රාජන්‍යඃ කෘතඃ
ඌරුතදස්‍ය යද් වෛශ්‍යඃ - පද්භ්‍යාම් ශූද්‍රෝ අජායත" (සෘග් 10.90)

- මෙම ඉගැන්වීම වර්ණ ධර්ම නමින් හැඳින්වූ බව.
- බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශූද්‍ර යන සමාජ සංස්ථා හතර චතුර් වර්ණය නම් වන බව.
- මීට අමතරව භගවත් ගීතාවේ ගුණය හා කර්මය පදනම් කරගෙන චතුර් වර්ණය ඇතිවූ බව සඳහන් තොරතුර ද පිළිතුරට ඇතුළත් විය හැකිය. (ලකුණු 04)

ii. වෛශ්‍ය වර්ණයට අයත් ස්ව ධර්ම නම් කරන්න.

'' ප්‍රජානං රක්ෂණං දාන - මිජ්‍යාධ්‍යයනමේවච
විෂයේශ්ව ප්‍රශක්තිශ්ච - ක්ෂත්‍රියස්‍ය සමාසතඃ" (මනු 1:89)

- ප්‍රජා රක්ෂණය, දන්දීම, යාග කිරීම, ඉගෙනීම, කාමයෙහි නොඇලීම, ක්ෂත්‍රියන්ගේ කාර්යයන් බව. (ලකුණු 04)

iii. වානප්‍රශ්ථ ආශ්‍රම ධර්මය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

- තවුස් දම් රැකීම සඳහා වනගත වීම මෙම ආශ්‍රමයේදී සිදු වේ.
- දරු මුණුපුරන් ලැබීමෙන් පසු භාර්යාව සමග හෝ හුදකලා ව වනගත විය යුතු ය.
- කාමභෝගී ජීවිතයෙන් සම්පූර්ණයෙන් ඉවත් විය යුතු ය.
- වනයෙන් සොයා ගන්නා ලද පලවැල ආහාරයට ගනිමින් හෝ පිඬු සිඟා යාමෙන් යැපිය යුතුය.
- හෝම ගින්න නොනිවා පවත්වාගෙන යා යුතු ය. (ලකුණු 04)

iv. ආපද් ධර්ම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි විස්තර කරන්න.

- විපත්තීන් ලෙස බලපාන පොදු ආපදාපන්න තත්වයන් හෝ ඒ ඒ වර්ණයන්හි පුද්ගලයින් හට තම වර්ණයට නියමිත කාර්යන් ඉටුකිරීමට නොහැකි කිසියම් වූ ශාරීරික පීඩාවක් ඇති වූ අවස්ථාවන් අපදාපන්න අවස්ථා ලෙෂ සැළකේ. එහිදී අනුගමනය කිරීම සඳහා නිර්දිෂ්ට ධර්මය ආපද් ධර්මය නමින් හැඳින්වයි.
- ආපදා අවස්ථාවක දී බ්‍රාහ්මණයාට ක්ෂත්‍රිය, වෛශ්‍ය යන වර්ණවලට අයත් කටයුතුවල නිරත විය හැකි බව.
- සෙසු වර්ණවල ජනයාට පහළ ශ්‍රේණිවලට අයත් කටයුතු කිරීමට හැකි වන අතර ශුද්‍රයනට අයත් කාර්යයන් කිසි සේත් ම වෙනස් නොවන බව.
- පහළ වර්ණවල ජනයාට, ඉහළ වර්ණවල ජනයාගේ කටයුතු කිරීමට නොහැකි බව. (ලකුණු 04)

v. චතුර් ආශ්‍රම බුදු දහමින් ප්‍රතික්ෂේප වන ආකාරය පෙන්වා දෙන්න.

- පුද්ගල ස්වාධීනත්වය බුදු දහමින් අවධාරණය කරන බැවින් තම ජීවිතය ද තමනට කැමැති ආකාරයෙන් පවත්වාගෙන යාමේ නිදහස පවතින බව
- විශේෂයෙන් බ්‍රහ්මචාරී ජීවිතය බුදු දහමින් අගය කරන අතර එය එක් අවධියකට පමණක් සීමාකොට නොතිබීම
- බුදු දහම අනගාරික ජීවිතය අගය කරන අතර ඒ සඳහා වැඩි අවධානයක් ආශ්‍රම ධර්ම තුළින් නොලැබීම
- අධ්‍යාත්මික විමුක්තිය උදාකරගැනීම උදෙසා අනගාරික ජීවිතය වැදගත් වන අතර එය ජීවිතයේ සැඳ සමයට සීමාකිරීමෙන් අපේක්ෂිත බලාපොරොත්තු ඉටුකරගැනීමට අපහසුවන බව
- සහජ කුසලතාවනට මේ තුළින් අවස්ථාව උදා නොවන බව (ලකුණු 04)

2. i සොළොස් මහා ජනපද බිහිවීම කෙරෙහි බලපෑ ඓතිහාසික සංසිද්ධිය කෙටියෙන් දක්වන්න.

- ක්‍රි.පූ. 8 වන සියවසේ නිචක්ෂු රාජ්‍ය වකවානුවේ පෞර රාජ්‍ය බිඳ වැටීම හා අග නගරය මාරුවීම නිසාත් ප්‍රාදේශික රජවරු විසින් කුඩා කුඩා රාජ්‍ය පිහිටුවා ගැනීම නිසාත් ජනපද සොළොසක් ඇති වූ බව. (ලකුණු 04)

ii සොළොස් මහා ජනපද නම් කරන්න.

- අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේති, වත්ස, කුරු, පංචාල, මත්ස්‍ය, සූරසේන, අස්සක, අවන්ති, ගන්ධාර, කාම්බෝජ ඒ ජනපද සොළොස වන බව. (ලකුණු 04)

iii මගධ රාජ්‍යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

- උතුරෙන් ගංගා නදිය ද නැඟෙනහිරින් චම්පා නදිය ද නිරිතෙන් වින්ධ්‍යා කඳුවැටිය ද බටහිරින් සෝණ නදිය ද සීමා කොටගත් ප්‍රදේශය මගධ දේශයට අයත් වූ බව.
- රජගහ නුවර මගධයෙහි අගනුවර වූ අතර, බිම්බිසාර හා අජාසත් යන රජවරුන් බුද්ධ කාලීන පාලකයන් වූ බව.
- වේභාර, වේපුල්ල, ගිජ්ඣකූට, ඉසිගිලි, පාණ්ඩව යන පර්වත පහකින් වට වී පිහිටීම නිසා එය 'ගිරිබ්බජ' යන නමින් ද ප්‍රකට ව පැවති බව.
- විවිධ ක්‍රම මඟින් සමීප රාජ්‍ය යටත් කොට ගෙන සිය බලය පුළුල් කරගැනීම සඳහා ක්‍රියා කළ බිම්බිසාර රජ අධිරාජ්‍යයක් ගොඩනඟා ගැනීමට වෑයම් කළ පැරණි ම භාරතීය පාලකයා ලෙස ද සැලකෙන බව. (ලකුණු 04)

iv රාජාණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ හතරක් ගෙනහැර දක්වන්න.

- මගධ, කෝසල, වත්ස, අවන්ති ලෙස ප්‍රබල රාජාණ්ඩු සතරක් පැවති බව.
- එම රාජ්‍යවල පැවති මූලික ලක්ෂණ පහත සඳහන් ඒවා බව.
- මහරජ කෙනකු විසින් පාලනය කිරීම.

- බොහෝ විට පිය පුතු පරපුරෙන් රජ පදවිය උරුම වීම.
- ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල රජුට හිමි වීම.
- රජතුමා නීති පැනවීම, නීති ක්‍රියාත්මක කරවීම හා දඬුවම් පැමිණවීම.
- යුවරජ, පුරෝහිත, අධිකරණ නායක, සේනාධිපති මඟින් බලය ක්‍රියාත්මක වීම.
- දුර්වල අසල්වැසි රාජ්‍යවල පාලකයන් පරදවා තම බලය පුළුල් කර ගැනීමට 'මත්ස්‍ය න්‍යාය' ක්‍රියාත්මක කිරීම. (ලකුණු 04)

v ගණතන්ත්‍ර හෙවත් සමූහාණ්ඩු පාලනය යනු කුමක්දැයි පෙන්වා දෙන්න.

- ව්‍යවස්ථාදායක, විධායක. අධිකරණ යන ත්‍රිවිධ බලතල, කණ්ඩායමක් මඟින් ක්‍රියාත්මක කිරීම සමූහාණ්ඩුවක ලක්ෂණය බව.
- බුද්ධ කාලීන භාරතයේ වජ්ජි හා මල්ල වශයෙන් ප්‍රධාන ගණතන්ත්‍ර රාජ්‍ය දෙකක් පැවති බව.
- ප්‍රාදේශීය පාලකයන් සමූහයක් එක් ව සාමූහික ව සාකච්ඡා කොට, සාමූහික ව තීරණ ගෙන, ක්‍රියාත්මක කිරීම ගණතන්ත්‍ර පාලනයක විශේෂ ලක්ෂණයක් බව.
- සප්ත අපරිහානීය ධර්ම පදනම් කොටගත් සාර්ථක ගණතන්ත්‍ර පාලන ක්‍රමයක් බුද්ධ කාලීන වජ්ජි රාජ්‍යයෙහි ක්‍රියාත්මක වූ බව හා එය බුදු රදුන්ගේ ප්‍රශංසාවට ලක් වූ බව. (ලකුණු 04)

3. i ආජීවක හා ජටිල යන ශ්‍රමණ ගුරුකුල දෙක පිළිබඳ හැඳින්වීමක් කරන්න.

- ආජීවක : අතින් දණ්ඩක් දරා සිටි අත්තකිලමථානුයෝගී ව උග්‍ර තපස් ව්‍රත අනුගමනය කළ ශ්‍රමණයන් ආජීවකයන් වූ බව.
- ජටිල : මොවුන් හිසෙහි ජටාවක් දැරූ බව, ඇතැමුන් සංචාරක පැවිදි දිවියක් ගත කළ බව, ඇතැමුන් ස්ථිර ආරාමවල ජීවත් වූ බව හා ගිනි දෙවියන් පිදීමට ද උදක ශුද්ධියට ද ප්‍රමුඛත්වයක් ලබාදුන් බව. (ලකුණු 04)

ii ශ්‍රමණ සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණ හතරක් නම් කරන්න.

- සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය බැහැර කළ බව.
- වේදය පරම සත්‍යය ලෙස පිළිගත් බ්‍රාහ්මණ ඉගැන්වීම බැහැර කළ බව.
- සියලු ලෞකික ලෝකෝත්තර සැප පිණිස යාගය අර්ථ සම්පන්න සංස්කාරයක් ලෙස පිළිගත් බ්‍රාහ්මණ මතය බැහැර කළ බව.
- විමුක්තිය පිණිස ඵලදායී ප්‍රතිපදාව කර්ම මාර්ගය නොව ඥාන මාර්ගය වැඩීම ලෙස පිළිගත් බව.
- බ්‍රහ්මචර්යාව හා අනගාරික ප්‍රතිපදාව පිළිගත් බව.
- චින්තන නිදහස ගරු කිරීම, කාන්තා නිදහස අගය කිරීම, උපත පදනම් කරගත් සමාජ වර්ගීකරණයන් බැහැර කිරීම ආදිය ශ්‍රමණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ ලෙස සැලකිය හැකි බව. (ලකුණු 04)

iii සම්මාපාය යාගය හඳුන්වන්න.

- මෙහි සතුන් බිලිදීමක් පිලිබඳ වාර්ථා නොවේ. පෙරදී නියම කරගත් දිනයකදී වියසිදුරේ ගසන ලද ලී කැබැල්ල විසිකරණු ලබයි. එම ලී කැබැල්ල වැටුන තැන දක්වා යාගය සඳහා වේදිකාව සකස්කරනු ලබයි. අනතුරුව යාගය සඳහා අවශ්‍ය වස්තුව රැස්කර යාග මන්ත්‍ර ප්‍රකාශ කරමින් යාග ද්‍රව්‍ය සහිතව සරස්වති නදියේ ගිලෙමින් පසුපසට ගමන් කරයි. මේ අයුරින් පවත්වනු ලබන යාගය සම්මාපාය නම් වේ. (ලකුණු 04)

iv බ්‍රාහ්මණ යාගය වෙනුවට බුදුරදුන් නිර්දේශිත ක්‍රියාකාරකම පෙන්වා දෙන්න.

- විනාශකාරී යාගය වෙනුවට බුදු සමය හඳුන්වාදුන්නේ දානයයි.
- හිංසනාත්මක විපත්තිකාර සදාචාර විරෝධී යාග ක්‍රමය දී. නි. කූටදන්ත සූත්‍රයෙහි ප්‍රතික්ෂේපකර ඇත
- රාග. දෝස මෝහ දුරුකිරීමට යාගයෙන් කිසිදු අනුබලයක් නොලැබේ.
- සත්ව හිංසනයෙන් තොර වී සියලු ෂත්වයින් වෙත හිතානුකම්පීව ජීවත්විය යුතුබව උගන්වයි.
- කරණීය මෙත්ත සූත්‍රයේ සියලු ෂතුන්ට ආදරය, කරුණාව, දැක්විය යුතුබව උගන්වයි. (ලකුණු 04)

v බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය සෙසු ශ්‍රමණ සම්ප්‍රදායන්ගෙන් වෙනස් වන මූළික ලක්ෂණ හතරක් දක්වන්න.

- සන්සුන් ඉඳුරන් ඇති, පිරිසිදු කසාවත් දරන, සංවර ඉරියවු වලින් යුත,, ශීලාදී ගුණධර්මයන්ගෙන් යුතු, බිමට හෙළන ලද ඇස් ඇති, හිස රැවුළු මුඩු කළ, සන්සුන් ව ගමන් කරන, සුපටිපන්න ශ්‍රමණ පිරිසක් බව.
- පිණ්ඩපාතික ව එක් වේලේ පමණක් ආහාර ගන්නා, සරල දිවි පෙවෙතක් ගත කරන පිරිසක් බව.
- අට ලෝ දහමින් කම්පා නොවන අතත්කිලමථානුයෝගයෙන් හා කාමසුඛල්ලිඛානුයෝගයෙන් බැහැර වූ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන පිරිසක් බව.

- අතීතය හා අනාගතය පළිබඳ ශොක් නොඋපදවන, වර්තමානයෙන් යැපෙන, ප්‍රසන්න පෙනුමෙන් යුතු ශ්‍රමණ පිරිසක් බව. (සමිද්ධි සූත්‍රය)
- පුද්ගල ස්වාමිත්වය අගය කළ පිරිසක් බව.
- පාරිශුද්ධ වූ කාය, වාක්, මනඃ කර්ම ඇති බව.
- අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධත්වයෙන් යුක්ත වූ බව.
- නිවන මූලික පරමාර්ථය කොට ගෙන ඊට අදාළ ප්‍රතිපත්ති පිරූ පිරිසක් බව.
- සියලු දෘෂ්ටි ග්‍රහණයන්ගෙන් සහ උපාදානයන්ගෙන් තොර නිදහස් චින්තනය අනුව ක්‍රියා කළ පිරිසක් බව. (ලකුණු 04)

ii කොටස

4. i කර්මය පිළිබඳ පෙන ඉගැන්වීම් පැහැදිලි කොට එය බුදු සමයෙහි කර්ම සංකල්පයෙන් වෙනස්වන අයුරු පැහැදිළි කරන්න.
   - සියලු සැප දුක් පෙර කරන ලද කර්මයට අනුව සිදු වේ ය යන්න පුබ්බේකතහේතුවාදය බව.
   - පෙර කළ කර්ම ගෙවා දැමීමෙන් සහ නව කර්ම නො කිරීමෙන් දුකින් නිදහස් වන බව.
   - කායදණ්ඩ, වචීදණ්ඩ, මනෝදණ්ඩ යනුවෙන් ත්‍රිවිධ දණ්ඩයක් ඇති අතර කායදණ්ඩය වඩාත් ප්‍රබල යයි මෙතුමා ඉගැන්වූ බව.
   - සියලු කායික, වාචසික, මානසික ක්‍රියා සඳහා චේතනාව ප්‍රමුඛ වේ ය යන බුදුදහමේ ඉගැන්වෙන මිනිස් ක්‍රියාකාරකම්වල මානසික පදනම මඟින් පෙන කායදණ්ඩ වාදය බිඳවැටෙන බව.
   - සියල්ල පෙර කරන ලද කර්මයට අනුව සිදු වන්නේ නම් පෙන ප්‍රතිපදාවේ එන අත්තකිලමථානුයෝගය ද පූර්වකෘත කර්මඵල ලෙස බුදුදහම මඟින් ඉගැන්වෙන බව.
   - බුදුසමය කර්ම විපාක සිද්ධාන්තය පිළිගත්ත ද පුබ්බේකතහේතුවාදය සපුරා ප්‍රතික්ෂේප කරන බව. (ලකුණු 10)

   ii අජිත කේෂකම්බලී ශාස්තෘවරයාගේ දර්ශනය පිලිබඳ හැඳින්වීමක් කොට එය බුද දහමින් බැහැර වන්නේ කුමක් නිසාදැයි විමසන්න.
   - දුන් දේහි ඵල නැත. යාගයෙහි ඵල නැත. කුසලා කුසල කර්මයන්ගේ ඵල විපාක නැතැයි දක්වන මොහුගේ ඉගැන්වීම අකිරියවාදී ඉගැන්වීමක් බව.
   - දානය, යාගය, හෝමය, මව, පියා, මෙලොව, පරලොව ආදි සියලල් ප්‍රතික්ෂේප කරන මොහු සතර මහා භූතයන් පමණක් ස්ථිර පදාර්ථ ලෙස පිළිගන්නා බැවින් භෞතිකවාදියකු බව.
   - මරණින් පසු සත්ත්වයාගේ සතර මහා භූත විශ්වයේ සතර මහා භූතවලට එකතු වන බවත්, දානාදියෙන් යහපතක් නැති බවත් බාල, පණ්ඩිත සියලු දෙනා මරණයෙන් විනාශයට, කෙළවරට පත්වන බවත් දක්වෙන මෙම ඉගැන්වීම උච්ඡේදවාදයක් බව.
     නත්ථි මහරාජ දින්නං නත්ථි යිට්ඨං, නත්ථි හුතං නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ, නත්ථි අයං ලෝකෝ, නත්ථි පරොලොකො, නත්ථි මාතා, නත්ථි පිතා නත්ථි සත්තා, ඕපපාතිකා නත්ථි ලෝකේ සමණ බ්‍රාහ්මණා, සම්මග්ගතා සම්මාපටිපන්නා යේ ඉමඤ්ච ලෝකං, පරඤ්ච ලෝකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදෙන්ති, චාතුම්මහා භූතිකො අයං පුරිසෝ යදා කාලංරෝති පඨවි පඨවි කායං අනුපේති අනුපගච්ඡති ----
   - පුඤ්ඤපාප, කුසලාකුසල ක්‍රියාවන්ගේ ඵලවිපාක ද ප්‍රතික්ෂේප කරන අජිත කේසකම්බලි ශාස්තෘවරයා මරණින් මතු සියල්ල අවසන් වේ ය යන උච්ඡේදවාදයක් ඉදිරිපත් කොට ඇති බව.
   - ''ලෝකසමුදයං බෝ කච්චාන සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලෝකේ නත්ථිතා සා න හෝති '' යනුවෙන් පටිච්චසමුප්පන්න ව සත්ත්වයාගේ, ලෝකයේ හටගැනීම හා පැවැත්ම මනාවූ නුවණින් දකින්නාට නාස්තික දෘෂ්ටිය හෙවත් උච්ඡේද දෘෂ්ටිය ඇති නොවන බව.
   - සත්ත්වයාගේ පැවැත්ම මරණයෙන් අවසන් නොවන්නේ යැයි අවධාරණය කරන බුදුසමය පුනර්භවය පිළිගන්නා බව.
   - කර්ම විපාක සිද්ධාන්තය පිළිගන්නා බුදුසමය පුද්ගලයා විසින් සචේතනව කරනු ලබන කුසලාකුසල කර්මයන්ගේ ඵලවිපාක දිට්ඨධම්මවේදනයී, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය වශයෙන් සංසාරගත ජීවිතය තුළ දී විඳීමට සිදුවෙති යි පවසන බව.

- නත්ථි දින්නං නත්ථි යිට්ඨං ..... ආදි දසවස්තුව මිථ්‍යාදෘෂ්ටියක් ලෙස බැහැර කරන බුදුසමය අත්ථි දින්නං අත්ථි යිට්ඨං අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං ඵලං විපාකෝ .... යනාදි දසවස්තුක සම්මා දිට්ඨියක් මහාචත්තාරීස ආදි සූත්‍රයන්හි දක්වා ඇති බව.
- දානා දි සත්ක්‍රියාවල ඵල විපාක ප්‍රතික්ෂේප කිරීම හා සත්ත්වයාගේ සාංසාරික පැවැත්ම බැහැර කිරීම යන අජිතකේසකම්බලි ශාස්තෘවරයාගේ ඉගැන්වීම් සමාජ සදාචාරයෙහි පැවැත්මට ප්‍රබල බාධකයක් බව. (ලකුණු 10)

5. i බුදුරජාණන් වහන්සේ බ්‍රාහ්මණයින් ඉදිරිපත් කළ වර්ණ භේදයේ නිස්සාරත්වය ප්‍රකට කරලීම උදෙසා ඉදිරිපත් කළ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.
   - වර්ණ භේදවාදයට පදනම් වූ නිර්මාණවාදී බ්‍රාහ්මණ චින්තනය මුලුමණින්ම ප්‍රතික්ෂේපකරන බුදු සමය අග්ගඤ්ඤ සූත්‍රයේදී සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවයත් විකාශයත් පෙතිහාසිකව පටිච්චසමුප්පාද සිද්ධාන්ත අනුව සිදු වූවක් බව පෙන්වා දෙයි.
   - මානව වර්ගයාගේ ඒකත්වය ජීව විද්‍යාත්මක පදනමකින් වාසෙට්ඨ සූත්‍රයේදී පැහැදිළිව විග්‍රහකොට ඇත. (යථා ඒතාසු ජාතීසු ------)
   - සෑම මිනිසෙක් ම වෘත්තීය අනුව විවිධ නාමයෙන් හඳුන්වන නමුදු ජන්මය ඔහුගේ වර්ණය නිර්ණය නොකරයි. බමුනෙකු හෝ අබ්‍රාහ්මණයෙකු වන්නේ ක්‍රියාවෙන් බව වාසෙට්ඨ හා භාරද්වාජ බමුණන්ට බුදු රජාණන් වහන්සේ පැහැදිළි කරදුන්හ.
   - දී. නි. අම්බට්ඨ සූත්‍රයේ බමුණන් අතිමානයෙන් සැලකූ කුල පාරිශුද්දීය ද මිථ්‍යා විශ්වාසයක් බව පැහැදිළි කරයි.
   - ම . නි. මධුර සූත්‍රයේදී මිනිසුන් අතර ජාති හෝ වර්ණ භේදය නොපැවැතිය යුතු බව අතාර්කික හා සමාජවිද්‍යාත්මක පදනමකින් යුතුව කරුණු දක්වා ඇත.
   - ම. නි අස්සලායන සූත්‍රයට අනුව ඇතැම් ප්‍රදේශවල පාලක පාලිත දෙපක්ෂය මිස චතුර්වර්ණයක් නොසිටියේයැයි ද වරින්වර ඔවුනොවුන් පරදවා රටේ පාලන බලතල අල්ලාගැනීමෙන් ආර්යන් දාසයන් වන බවත් දාසයන් ආර්යන් වන බවත් දක්වා තිබේ.
   - වසල සූත්‍රයේදී පුද්ගලයෙකුගේ හොඳ හෝ නරක තීරණය වන්නේ ඔහුගේ ක්‍රියාවෙන් මිස උපතින් නොවන බව වසල සූත්‍රයේ දක්වා ඇත.
   - වර්ණ භේදයකින් තොරව කර්මවල ඵල විපාක ලැබෙන බව වරක් බුදුරජාණන් වහන්සේ මධුර රජතුමාට කළ ප්‍රකාශයෙන් ද පැහැදිළිවන බව. (ලකුණු 10)

   ii ස්ව ධර්ම සංකල්පයෙන් බමුණන් සමාජ ආධිපත්‍යය තහවුරු කරගැනීමට ගත් උත්සහය ප්‍රකට කරන්න.
   - චතුර් වර්ණයට පවරණ ලද කාර්යන් ස්වධර්ම වන අතර එය දිව්‍යමය නිර්මාණයක් බව පවසමින් සිය ආධිපත්‍යය තහවුරු කරගැනීමට කටයුතු කර ඇත.
   - සමාජයේ උසස් යැයි සම්මත සියලු වගකීම් බ්‍රාහ්මණයින් විසින් පවරාගෙන ඇති බව
   - අධ්‍යාපනය, ආගමික කටයුතු, දානය, දන් පිළිගැනීම, යාගපැවැත්වීම, රාජ්‍ය උපදේශනය යන තේමාවලින් සමාජ ආධිපත්‍යය තහවුරුකරගත් ආකාරය වෙන වෙන ම විස්තරවිය යුතුය. (ලකුණු 10)

6. i ස්ත්‍රීත්වය පිළිබඳ බ්‍රාහ්මණ සමාජයේ පැවැති ආකල්පය උදාහරන සහිතව පැහැදිලි කරන්න.
   - බුද්ධ කාලීන භාරතීය සමාජය පුරුෂාධිපත්‍යයෙන් යුක්ත වූ බව.
   - බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව කාන්තාවට ආගමික, සාමාජික, ආර්ථික හා දේශපාලන නිදහස සීමා කර තිබූ බව.
   - සැමියා මළ කල්හි භාර්යාව සති පූජාව නම් ආගමික කාර්ය කළ යුතු යැයි පිළිගත් බව.
   - ස්ත්‍රිය බාල වියේ දී දෙමාපියන් යටතේ ද, තරුණ වියේ දී ස්වාමිපුරුෂයා යටතේ ද, මහලු වියේ දී වැඩිමහල් පිරිමි දරුවා යටතේ ද ජීවත් විය යුතු යැයි සැලකුණු බව.
   - ස්ත්‍රිය විශ්වාස නොකටයුතු, පහත්, චපල දුසිරිත්හි ම යෙදෙන තැනැත්තියක ලෙස සැලකූ බව.
   - ඉඩ ලද සැම මොහොතේ ම කාන්තාව වරදෙහි බැඳෙන තැනැත්තියක ලෙස පිළිගත් බව. (ලකුණු 10)

   ii ගෘහ සමාජය තුළ කාන්තාවට අභිමානවත් ලෙස දිවිගෙවීමට අවස්ථාව බෞද්ධ ඉගැන්වීම් තුළින් ලබාදී ඇති අයුරු සහේතුකව පෙන්වා දෙන්න.

- මවක් වශයෙන් ඇයව සමාජය තුළ සම්මානනයට හා පිළිගැනීමට ලක්කර තිබූ අයුරු විස්තර විය යුතුය.
- බිරිඳක් වශයෙන් ඇයට සමාජ වරප්‍රසාද හිමිකර දී තිබූ අයුරුත් බිරිඳක් වශයෙන් සමාජය තුළ ගෞරවයට පාත්‍රවන ආකාරය සූත්‍ර දේශනා මගින් පෙන්වා දී ඇතිබව (සිගාලෝවාද සූත්‍රය සප්ත භරිය සූත්‍රය, චතු සංවාස සූත්‍රය පඨම සමජීවී හා දුතිය සමජීවී සූත්‍ර)
- උපාසිකාවක් වශයෙන් අධ්‍යාත්මික ශික්ෂණය උදාකරලීමට කාන්තාවට ද අවස්තාව ලබාදී ශාසනික තනතුරු ද ප්‍රදානය කිරීමට යොමුවීම
- ධීතු සූත්‍රය තුළින් කාන්තාවගේ වටිනාකම ඇගයීමට ලක්කිරීම (ලකුණු 10)

7. i බුද්ධකාලීන භාරතයේ පැවැති වාණිජ ක්ෂේත්‍රයෙහි දියුණුව පෙන්වා දෙමින් ඒ තුළින් ඇති වූ සමාජ පරිවර්තනයන් දක්වන්න.
   - ක්‍රි. පූ . 6 වන සියවස වන විට භාරතීය සමාජය ධනෝපායනයේදී කෘෂි කර්මාන්තය, සත්ව පාලනය, රාජ්‍ය සේවය වෙනත් ශිල්ප කර්මාන්ත ආදී වශයෙන් වෘත්තීන් ගණනාවක් පැවැති අතර එයින් වෙළඳාම ද ප්‍රධාන ජීවනෝපායක් ලෙසයෙන් පැවැති බව
   - මධුරා, චම්පා, වේසාලි, උජ්ජේනි ආදියද නාගරික පරිසරයක පැවැති බව.
   - රාජ්‍යයන් අතර හා ජනකොටස් අතර පැවැති නිරන්තර යුදගැටුම් නිසා වාණිජ්‍යමය නිෂ්පාදන සඳහා ඉල්ලුම වැඩිවීම
   - භාණ්ඩ හුවමාරු ක්‍රමයෙන් ඈත් වී මුදල් භාවිතයට යොමුවීම
   - දේශීය මාර්ග පද්ධතිය දියුණු වී ජාත්‍යන්තර මාර්ග හා බද්ධ වීම. ගොඩබිම් මාර්ග ඔස්සේ වෙළදාම් කටයුතු සිදු කිරීම, භාරුකච්ච, සුප්පාරක, තම්‍රලිප්ත වැනි වෙළඳ වරායවල් බිහිවීම සුළු හා මහා පරිමාණ වෙළදාම් කටයුතු සිදුවීම.
   - විනෝදාස්වාදය ගෙන දෙන උත්සව සැණකෙලි ක්‍රියාත්මකවීම, සුරාසැල් ගණිකාවෘත්තිය ප්‍රභලව ක්‍රියාත්මකවීම.
   - වෙළදාමෙන් ධනය උපයාගත් වෛශ්‍යයෝ වෙළඳ ශ්‍රේණි වශයෙන් සංවිධානය වී එහි නායකයා සිටු තත්වයට පත්වීම
   - සංචාරක වෙළදාම, පදික වෙළදාම, ස්ථාවර වෙළදාම දේශීය හා විදේශීය වෙළදාම සුළු මධ්‍යම හා මහා පරිමාණ වශයෙන් දියුණු වූ අතර වෘත්තීය වශයෙන් සංවිධානය වීම
   - සැවැත්නුවර සිට සාකේත, කෞෂාම්බි, විදිසා, උදේනි හරහා එක් වෙළඳ මාවතක් ද සැවැත්නුවර සිට රජගහනුවර දක්වා කපිලවස්තු, කුසිනාරා, විශාලා, පැළලුප් නුවර හරහා තවත් වෙළ ද මාවතක් ද වශයෙන් නව වෙළඳ මාවත් තුනක් තිබූ බව (ලකුණු 10)

   ii බුද්ධකාලීන භාරතීය පාලකයින් සහ බුදුරජාණන් වහන්සේ අතර පැවැති සබඳතා බුදු දහමේ උන්නතියට මෙන්ම පාලකයින්ගේ උන්නතියට ද හේතු වූ අයුරු විමසන්න.
   - බුද්ධ කාලීන මගධ දේශයේ පාලකයා වූ බිම්බිසාර රජු බුදුරජාණන්වහන්සේ සමඟ බුද්ධත්වයට පෙර සිට ම මිත්‍රත්වයක් පැවැත් වූ බව.
   - බුද්ධත්වයෙන් පසු ව බිම්බිසාර රජුට දහම් දෙසීම සඳහා බුදු රජාණන් වහන්සේ වැඩම කළ බව.
   - තිරෝකුඩ්ඩ සූත්‍රය සේනිය බිම්බිසාර රජු සඳහා දේශනා කළ බව.
   - වේළුවන උයන බිම්බිසාර රජු විසින් බුදු රජාණන් වහන්සේ වෙත පූජා කරන ලද අතර, එය ප්‍රථම ආරාම පූජාව ලෙස සැලකෙන බව.
   - බිම්බිසාර රජුගේ ඉල්ලීම මත රාජ භටයන් පැවිදි නො කළ යුතු යැයි අනුදැන වදාළ බව.
   - බිම්බිසාර රජතුමාගේ ඉල්ලීම පරිදි උපෝසථ කර්මය අනුදැන වදාළ බව අදත්තාදාන පාරාජිකාව පැනවූ බව.
   - සාමඤ්ඤඵල සූත්‍රය අජාසත් රජු අරභයා දේශනා කළ බව.
   - සුනීධ හා වස්සකාර ඇමතිවරුන් උපදෙස් ලබා ගැනීම සඳහා අජාසත් රජු විසින් බුදු රජාණන් වහන්සේ වෙත යොමු කරන ලද බව.
   - බුදු රජාණන් වහන්සේ වස්සාන කාල විසිපහක් කෝසලයේ ගත කළ බව.
   - තමන් බුදු රජාණන් වහන්සේ සමඟ කරුණු කිහිපයකින් සමාන යැයි කොසොල් රජු පවසා ඇති බව.
   - කොසොල් රජු අරභයා සූත්‍ර රාශියක් දේශනා කර ඇති බව.
   - කොසොල් රජු නිතර නිතර බුදු රජාණන් වහන්සෙ ්සමඟ ධර්ම සාකච්ඡාවන්හි නිරත වූ බව.
   - රජුගේ පෞද්ගලික ප්‍රශ්න විසඳා ගැනීමට පවා බුදු රජාණන් වහන්සේ පිහිට වූ බව.

- පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගෙන් ධර්මය අසා උදේන රජු තෙරුවන් සරණ ගිය බව.
- උදේන රජතුමාගේ භද්‍රවතිකා ඇතින්න අරභයා කළගුණ සැලැකීමේ අගය දේශනා කළ බව.
- මහාකච්චාන තෙරුන් වහන්සේගේ ධර්මය අසා චණ්ඩපජ්ජෝත රජු තෙරුවන් සරණ ගිය බව.
- වජ්ජි රාජ්‍යයට අයත් විශාලා මහනුවර තුන් බිය දුරු කිරීමට බුදු රජාණන් වහන්සේ රතන සූත්‍රය දේශනා කළ බව.
- වජ්ජීන්ට සප්ත අපරිහානීය ධර්ම දේශනා කළ බව.
- වජ්ජීන්ගේ කූටාගාර ශාලාව බුදු රදුන් නිරන්තර වැඩ සිටි ස්ථානයක් බව.
- මල්ල රජදරුවන්ගේ අඹ වනයේ බුදු රජාණන් වහන්සේ වැඩ සිටින අතර එහි දී ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද සිදු වූ බව.
- බුදු රජාණන් වහන්සේ කුසිනාරාවේ මල්ල රජදරුවන්ගේ උපවත්තන සල් උයනට පිරිනිවන් පෑම සඳහා වැඩම කළ බව. (ලකුණු 10)

8. i ඉට ශාස්තෘවරුන්ගේ ඇතැම් ඉගැන්වීම් තුළින් සදාචාරයට වටිනාකමක් ලබාදී නොමැති අයුරු පෙන්වා දෙන්න

- සදාචාරය යනු යහපත් හැසිරීමයි, ගුණගරුකව කටයුතු කිරීමයි, කුසල් අකුසල් පිළිබඳව සැළකිලිමත්ව ක්‍රියාකිරීමයි.
- පූර්ණ කාස්‍යපගේ අකිරියවාදී ඉගැන්වීම් තුළින් කුසල අකුසල ක්‍රියාවනට විපාක නොලැබෙන බව (ප්‍රාණීන් මරමින්, මරවමින්, සිඳමින්, සිඳවමින් ක්‍රියකළත් දන් දෙමින් දෙවමින් ක්‍රියාකළත් විපාක නොලැබෙනබව)
- මක්ඛලී ගොසාලගේ නියතිවාදී හා අහේතු අප්පච්චයතාවාදී ඉගැන්වීම් තුළිනුත් අජිත කේෂකම්බලීගේ දසවස්තුක මිථ්‍යා දෘෂටිය තුළිනුත් සදාචාරය නෙසලකා හැරෙන අයුරු විස්තර විය යුතුයි.
- පකුධ කච්චායන ශාස්තෘවරයාගේ සප්තකාය පදාර්ථවාදී හා ශාස්වතවාදී ඉගැන්වීම් තුළිනුත් සදාචාරය නොසලකා ඇතිබව
- සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාගේ සංසයවාදී හා අමරාවික්ඛේපවාදී ඉගැන්වීම් තුළින් සදාචාරයද සැකයට භාජනය වන බව
- නිගණ්ඨනාථපුත්තගේ ව්‍රත සමාදානය හා දිගම්හරවාදී ප්‍රතිපදාව තුලින් ද යම් ආකාරයට සදාචාරයට පටහැනි ඉගැනීම් ඉදිරිපත්වී ඇති බව (ලකුණු 10)

ii බුදු දහමින් ඉට ශාස්තෘවරුන්ගේ සදාචාර විරෝධී ඉගැන්වීම් ප්‍රතික්ෂේපවන අයුරු පැහැදිලි කරන්න.

- මිනිසා විසින් සචේතන කරනු ලබන හොඳ නරක ක්‍රියාවේ වගකීම පුද්ගලයාට නො පැවරෙන බැවින් මිනිසාට අවශ්‍ය ඕනෑ ම දුරාචාර ක්‍රයිාවක යෙදීමට ඉට ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් වලින් ඉඩ සැලසෙන බව.
- එහෙයින් සමාජය තුළ ආචාර ධර්ම අර්ථවත් කිරීමට නොහැකි වී සමස්ත සමාජය ම සදාචාරමය වශයෙන් මහත් පරිහානියට පත්වන බව.
- බුදුදහම කම්මවාදී, කිරියවාදී, විරියවාදී දහමක් බැවින් සචේතන ක්‍රියාවේ වගකීම කරන්නා විසින් ම දැරිය යුතු යැයි උගන්වන බව.
- පුනර්භවය හෙවත් සත්ත්වයාගේ සාංසාරික ප්‍රවෘත්තිය පිළිගන්නා බුදුසමය කර්ම විපාක සිද්ධාන්තය අවධාරණය කරන බව.
- සචේතනව සිදු කරනු ලබන පින් පව්, කුසල් අකුසල් අදාළ පුද්ගලයාට දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරිය වේදනීය වශයෙන් මෙලොව දී හෝ මතු ආත්මවල දී හෝ පලවිපාක ලබාදීමට ඉදිරිපත් වන බව.
- තමාට මෙරමාට හා උභය පක්ෂයට අනර්ථය පිණිස හේතු වන ප්‍රාණඝාතාදි සියලු දුසිරිත් අසාධු, අකරණීය, පාප අකුසල ලෙස හඳුන්වා ඒවායින් වැළකෙන ලෙස උපදෙස් දෙන බුදුසමය තමාට මෙරමාට හා උභය පක්ෂයට හිතසවු පිණිස පවතින දානාදි සත්ක්‍රියා සාධු, පුඤ්ඤ, කුසල ලෙස ඉහළින් අගය කරන බව.
- දානය, ඉන්ද්‍රිය දමනය, සීල සංවරය, සත්‍ය වචනය ආදි ක්‍රියා මෙලොව පරලොව ජීවිතය සුවපත් කිරීමට පමණක් නොව සාංසාරික දුක් කෙළවර කොට නිවන් පසක් කිරීමට ද ඉවහල් වන මහානිසංසදායක සදාචාරමය සත් ක්‍රියා ලෙස බුදුසමය මඟින් අගය කරනු ලබන බව. (ලකුණු 10)